# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශේෂ

අංක 1799/6 - 2013 පෙබරවාරි මස 27 වැනි බදාදා - 2013.02.27

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡේදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

**ජාතික රාජ්‍ය සභාවේ 1972 අංක 01 දරන ඉඩම් ප්‍රතිසංස්කරණ පනත**

22(1) ඊ වගන්තිය යටතේ වූ නියමය

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 44 වැනි ව්‍යවස්ථාවේ (2) ඡේදය සමග කියවිය යුතු කලින්කල සංශෝධිත ජාතික රාජ්‍ය සභාවේ 1972 අංක 1 දරන ඉඩම් ප්‍රතිසංස්කරණ පනතේ 22 වැනි වගන්තියේ (1) උප වගන්තියේ (ඊ) ඡේදය මගින් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර ජනාධිපති මහින්ද රාජපක්ෂ වන මම මෙම නියමය මගින්,

(අ) මෙම නියමයේ උපලේඛනයෙහි II වැනි තීරයේ නිශ්චිත ව දැක්වෙන කෘෂිකාර්මික ඉඩම් මෙම නියමයේ උපලේඛනයේ I වන තීරයේ ස්වකීය නම නිශ්චිත ව දක්වා ඇති තැනැත්තා වෙත පැවරිය යුතු බවටත් ;

(ආ) මෙම නියමයේ උපලේඛනයෙහි II වැනි තීරයේ අනුරූප සටහනේ නිශ්චිත ව දැක්වෙන කෘෂිකාර්මික ඉඩම, මෙම නියමයේ උපලේඛනයේ I වැනි තීරයේ ස්වකීය නම නිශ්චිත ව දක්වා ඇති තැනැත්තාට අයත් ව තිබූ බවත්, එකී කෘෂිකාර්මික ඉඩම එකී තැනැත්තා සාමාජිකයෙකු වන පවුලේ ප්‍රධානියාට අයත් බවට සලකනු ලැබූ ඉඩම් ප්‍රමාණයට ඇතුළත් කරනු ලැබූ බවත් ;

(ඇ) ඉහත කී පනත ප්‍රකාර ව කෘෂිකාර්මික ඉඩම් පිළිබඳ සීමාව පනවනු ලැබූ අවස්ථාවේ දී මෙම නියමයේ උපලේඛනයේ I වැනි තීරයේ නම සඳහන් තැනැත්තා වයස අවුරුදු 18 ට අඩු තැනැත්තකු වූ බවටත් ;

(ඈ) මෙම උපලේඛනයේ II වැනි තීරයේ නිශ්චිතව සඳහන් කෘෂිකාර්මික ඉඩම ඉහත කී පනතේ 22 වැනි වගන්තිය යටතේ කිසිම තැනැත්තෙකුට පවරනු නොලැබූ බවටත් ;

(ඉ) ඉහත කී කෘෂිකාර්මික ඉඩම් සම්බන්ධයෙන් ඉහත කී පනතේ 28 වැනි වගන්තිය යටතේ කිසිම වන්දි ගෙවීමක් සිදු කර නැති බවටත්,

මෙයින් ප්‍රකාශයට පත් කරමි.

මහින්ද රාජපක්ෂ,
ජනාධිපති.

2013 පෙබරවාරි මස 20 වැනි දින,
කොළඹ 01,
ජනාධිපති කාර්යාලයේ දී ය.

1A - G 17348 — 340 (2013/02)

*මෙම අති විශේෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

**උපලේඛනය**

| *I වන තීරය* | *II වන තීරය* |
|---|---|
| ධම්මික ජයනාත් අමරතුංග<br>අංක 57, ග්‍රෙගරි පාර,<br>කොළඹ 07. | වයඹ පළාතේ කුරුණෑගල පරිපාලන දිස්ත්‍රික්කයේ දඹදෙනි හත්පත්තුවේ, බටහිර උඩුකහ කෝරලේ, දකුණු පල්ලෙකැකුලාවල ග්‍රාමයේ පිහිටා ඇත්තාවූ ද ප්‍රසිද්ධ නොතාරිස් හෙන්රි ඩේවිඩ් රණසිංහ විසින් ලියා සහතික කරන ලද 1968.02.19 දින අංක 1148 දරන ඔප්පුවේ උපලේඛනයේ නිශ්චිත ව දක්වා ඇත්තා වූ ද කැකුලාවලවත්ත යනුවෙන් හැඳින්වෙන ඉඩම සඳහා බලයලත් මිනින්දෝරු කේ. කන්නන්ගර මහතා විසින් සාදන ලද 2003.06.11 දින සහ අංක 645/2003 දරන පිඹුරේ කැබලි අංක 2 ලෙස නිරූපණය කර ඇත්තා වූ ද උතුරට :- කැබලි අංක 1, නැගෙනහිරට :- කැබලි අංක 3 සහ මාර්ගය ද (ගම්සභා), දකුණට :- අවසාන ගම් පිඹුරෙහි නිරූපණය කර ඇති කැබලි අංක 108 ද, බටහිරට :- අවසාන ගම් පිඹුරෙහි නිරූපණය කර ඇති කැබලි අංක 1 A ද යන මායිම් තුළ පිහිටා ඇත්තා වූ ද කුරුණෑගල ඉඩම් රෙජිස්ට්‍රාර් කාර්යාලයේ ලියාපදිංචි වී ඇති, ප්‍රමාණයෙන් අක්කර එකයි රූඩ් තුනයි පර්චස් හතරක් වූ (අක්කර 01 රූඩ් 03 පර්චස් 04) ඉඩම සහ ඒ මත වූ සියලු ගොඩනැගිලි ගහකොළ සහ වෙනත් සියලු දේ ද සහ වයඹ පළාතේ කුරුණෑගල පරිපාලන දිස්ත්‍රික්කයේ, දඹදෙනි හත්පත්තුවේ, දකුණු උඩුකහ කෝරලේ, පල්ලෙකැකුලාවල ග්‍රාමයේ පිහිටා ඇත්තා වූ ද, ප්‍රසිද්ධ නොතාරිස් හෙන්රි ඩේවිඩ් රණසිංහ විසින් ලියා සහතික කරන ලද 1968.02.19 දින අංක 1148 දරන ඔප්පුවේ උපලේඛනයේ නිශ්චිත ව දක්වා ඇත්තා වූ ද, කැකුලාවලවත්ත යනුවෙන් හැඳින්වෙන ඉඩම සඳහා බලයලත් මිනින්දෝරු කේ. කන්නන්ගර මහතා විසින් සාදන ලද 2003.07.10 දින සහ අංක 650/2003 දරන පිඹුරේ කැබලි අංක 1 ලෙස නිරූපණය කර ඇත්තා වූ ද උතුරට :- ජේ. ඒ. අමරතුංග යන අයට අයත් කැකුලාවල වත්ත ද, ජෝන් අමරතුංග යන අයට අයත් අංක 484 දරන අවසාන ගම් පිඹුරෙහි නිශ්චිත ව දක්වා ඇති කැබලි අංක 64 ද, හබරලගහහින්න මූකලාන, කන්දාහේන මූකලාන, ජේ. පී. පුංචිබණ්ඩා සහ තවත් අයට, එස්. ආර්. එම්. පොඩිඅප්පුහාමි සහ තවත් අයට අයත් ඉඩම්ද, නැගෙනහිරට:- ජෝන් අමරතුංග යන අයට අයත් අංක 484 දරන අවසාන ගම් පිඹුරෙහි නිශ්චිත ව දක්වා ඇති කැබලි අංක 64 ද, හබරලගහහින්න මූකලාන, කන්දාහේන මූකලාන, ජේ. පී. පුංචිබණ්ඩා සහ තවත් අයට අයත් ඉඩම ද, කැකුලාවලවත්ත ඉඩමේ කොටසක්, මාර්ගය සහ කුරුන්ඩිවල වත්ත ද, දකුණට : කුරුන්ඩිවල වත්ත සහ මුගුරුගහ හේන ද, බටහිරට :- මුගුරුගහ හේන සහ මාර්ගය ද යන මායිම්වල පිහිටා ඇත්තා වූ ද කුරුණෑගල ඉඩම් රෙජිස්ට්‍රාර් කාර්යාලයේ ලියාපදිංචි වී ඇති ප්‍රමාණයෙන් අක්කර විසිඅටයි රූඩ් තුනයි පර්චස් විසි නවයයි දශම හතරක් වූ (අක්කර 28 රූඩ් 03 පර්චස් 29.4) ඉඩම සහ ඒ මත වූ ගොඩනැගිලි, ගහකොළ සහ වෙනත් දේ ද වේ. |

03 - 628

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.